අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 15 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරන් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණ විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඒෂියන් ෆවුන්ඩේෂන් මගින් පරිත්‍යාග කරන ලද පුස්තකාල පොත් 57 ක අගය තක්සේරුකර ගිණුම්වල ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනයට ලැබියයුතු උසාවි දඩ මුදල රු. 347,601 ක් ගිණුම්වල ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ උපකරණ සහ පොත්පත්වල වටිනාකම වන රු. 82,500 ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) විගණාධිපති දෙපාර්තමේන්තුවට ගෙවියයුතු විගණන ගාස්තු රු. 74,574 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා නොතිබුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි සනාදියට අනුකූල නොවීම
-------------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂනය විය.

| නීති, රීති යනාදියට යොමුව | | | අනුකූල නොවීම |
| --- | --- | --- | --- |
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | | |
| | (i) | පරිච්ඡේදය IV වගන්තිය 180 | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| | (ii) | පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) | පරිච්ඡේදය X වගන්තිය 191 | සමාලෝචිත වර්ෂයේදී සහ රැස්වීම් දොලහක් පවත්වා තිබුණද, එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iv) | පරිච්ඡේදය X වගන්තිය 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමග සංසන්දනය කර විචලනයක සඳහා හේතු දක්වන විස්තර ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (v) | පරිච්ඡේදය X වගන්තිය 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

1.3.4 නිසි අධිකාරි බලයෙන් තහවුරු නොවූ ගනුදෙනු

2010 වර්ෂය දක්වා අක්කරෙයි පත්තු ප්‍රාදේශීය සභාව වශයෙන් ක්‍රියාත්මකවූ මෙම ප්‍රාදේශීය සභාව 2011 වර්ෂයේ සිට අක්කරෙයි පත්තු ප්‍රාදේශීය සභාව සහ අක්කරෙයිපත්තු මහ නගර සභාව වශයෙන් පරිපාලන ඒකක දෙකක් වශයෙන් වෙන්කර වත්කම් හා බැරකම් වෙන්වෙන් වශයෙන් බෙදාදී තිබුණි. කෙසේවූවද, මෙසේ බෙදා වෙන්කළ වත්කම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2013 සහ 2014 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල සමස්ත එකතුව රු. 25,808,155.44 ක වත්කම් හා සමස්ත එකතුව රු. 2,398,774.79 ක වගකීම් ගිණුම්වලින් අඩුකර තිබුණි. මෙසේ වත්කම් හා වගකීම්වල වටිනාකම් අඩුකිරීම සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

අඩුකරන ලද වත්කම්වල එකතුව රු. 48,375 ක බැංකුවේ ස්ථාවර සහ ජංගම තැන්පත්වල තැන්පත් කරන ලද මුදල් වන අතර එය සනාථ කිරීම් සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 619,658 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 472,393 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 147,265 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 වරිපනම් බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් හා ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි විලින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීමට තටයුතු කර නොතිබුණි.

2.2.2 පුද්ගලික රථ ගාල් බදු මුදල

සමාලෝචිත වර්ෂය සඳහා අයවියයුතු රු. 10,000 පුද්ගලික රථ ගාල් ගාස්තු අයකර ගැනිමට කටයුතුකර නොතිබුණි.

2.2.3 දැන්වීම් පුවරු සහ සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමේ නොහැකිවීම නිසා සභා බල ප්‍රදේශයේ පුද්ගලික අයතන වලින් තමන්ගේ වෙළඳ භාණ්ඩ පිළිබඳ ප්‍රචාරය කිරීම සඳහා ඉදිකරන ලද දැන්වීම් පුවරු 03 ක් සඳහා සහ සන්නිවේදන ආයතනවලින් ස්ථාපිතකර තිබූ සන්නිවේදන කුළුණ 02 ක් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා අයකරගතයුතු රු. 60,000 ක් ආදායමක් අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

(අ) සභාවට අයත් කබ් රථය 2014 මාර්තු මාසයේදී රු. 58,395 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. අළුත්වැඩියා කටයුතු නිම කිරීමෙන් පසුව අළුත්වැඩියාව සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සහ ටෙන්ඩර් මණ්ඩල තීරණ ලබාගෙන තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන කිරීම වැසිකිළි ඉදිකිරීම, පොදු ළිං ඉදිකිරීම වැනි අත්‍යවශ්‍ය මහජන අවශ්‍යතා සඳහා මුදල් නොමැතිව තිබියදී සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද ගොඩනැගිලි විවෘත කිරීමේ උත්සවය සඳහා රු. 418,520 ක් මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. ඉන් රු. 148,800 ක් වේදිකා සැරසිලි සහ තොරණ් ඉදි කිරීම සඳහා වැයකර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය
---------------------------------
ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ ජාතික වැඩ සටහන
------------------------------------------------------

පළාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාවට රු. 4,000,000 ක් ලබාදී තිබුණි. ඉන් වැසිකිළි ඉදිකිරීම් සහ මාර්ග අළුත්වැඩියා කිරීම සඳහා රු. 2,440,087 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරනු නිරීක්ෂණ විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයයේ අංක 01/2014 දරණ චක්‍රලේඛය අනුව අදාල වැඩසටහන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් කරන ලද කර්මාන්තයන් සඳහා සභාවේ යන්ත්‍ර යොදාගතයුතු බව දන්වා තිබුණි. ඒසේ සභාව සතුව යන්ත්‍ර නොමැතිවූවිට එවැනි යන්ත්‍ර ලඟම තිබෙන පළාත් පාලන ආයතවලින් ලබා ගෙන වැඩ කළයුතුබව සඳහන් කර තිබුණද, එසේ නොකර ප්‍රජා මූලික සමිතිවලට කොන්ත්‍රාත් භාරදී ඉදිකිරීම් වැඩ නිමකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්මාන්තයේ විස්තර | සමිතියේ නම | කොන්ත්‍රාත් වටිනාකම |
|---|---|---|
| | | රු. |
| පොදු වැසිකිලිය | පට්ටියපිටි ප්‍රජා මධ්‍යස්ථානය | 360,000 |
| සොහොන්පිටිය | ආම්මාටි ප්‍රජා මධ්‍යස්ථානය | 780,000 |
| මාර්ග සංවර්ධන | ආම්මාටි ප්‍රජා මධ්‍යස්ථානය | 300,000 |
| පොදු වැසිකිලිය | ආම්මාටි ප්‍රජා මධ්‍යස්ථානය | 122,830 |
| මාර්ග සංවර්ධනය | ලීනා ප්‍රජා මධ්‍යස්ථානය | 635,379 |

(ආ) ඉහත චක්‍රලේඛයට අනුව මෙම අරමුදල නව වැඩ සටහන් සඳහා යොදවා නොගෙන දැනට තිබෙන මූලික පහසුකම් වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා යොදවා ගත යුතු බව සඳහන් කර තිබුණද අළුතින් වැසිකිළි ඉදිකිරීම් සඳහා මෙම අරමුදල යොදවා ගෙන තිබුණි.

5 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) ආදායම් රැස්කිරීම
(ඈ) කොන්ත්‍රාත් පරිපාලන